# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/02 - 2021

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.04.01

**අයවැය චක්‍රලේඛ අංක: 02/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022 දෙවන කාර්තුව**

2021 අංක 30 දරන විසර්ජන පනත මගින් වෙන්කර ඇති සීමාවන්ට යටත්ව 2022 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් බලය ලබාදෙමින් දෙවන කාර්තුවේ වියදම් දැරීමට හැකිවන පරිදි අදාළ අධිකාරී බලපත්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

02. ඒ අනුව, 2022 අප්‍රේල් මස 01 දින සිට ජූනි 30 දක්වා වන දෙවන කාර්තුව තුළ ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2022 අංක 2 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ) විශේෂ නීති සේවා සඳහා - 2022 අංක 2 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය
(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2022 අංක 2 දරන අත්තිකාරම් බලපත්‍රය

03. රාජ්‍ය නිලධාරීන්ට සහ මහජනතාව වෙත අමතර සහන සැළසීම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස සහ රාජ්‍ය ආදායම අපේක්ෂිත පරිදි රැස්කර ගැනීමට අපහසු වීම හේතුවෙන් වර්ෂය මුල දී පැවති රාජ්‍ය මූල්‍ය අවකාශය තවදුරටත් පටු වී ඇති බැවින් අයවැය කටයුතු වඩාත් අභියෝගකාරී වී ඇත. තවද, නව ව්‍යාපෘති සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම 2022 වර්ෂයට අදාළ විසර්ජන පනත මගින් වළක්වා ඇත. එබැවින්, අයවැය තුළ අන්තර්ගත නොවන ව්‍යාපෘති හා දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන ප්‍රමුඛ නොවන ව්‍යාපෘති සඳහා බැඳීම් ඇතිකර ගැනීම අත්හිටුවන ලෙසත්, එවැනි

ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් නොකරන ලෙසත් කාරුණිකව දැනුම්දෙමි.

04. මීට අමතරව, සැළසුම් කර ඇති ව්‍යාපෘති අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කිරීමේ දී වර්තමාන වෙළඳපළ තත්ත්වයන් හේතුවෙන් ඇතිවිය හැකි බාධාවන් පිළිබඳව සැළකිල්ලට ගනිමින් ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සුදුසු පරිදි ඉදිරි තීරණ ගැනීම පිළිබඳව ද ලේකම්වරුන් විසින් අවධානය යොමු කළ යුතු වේ.

05. ජාතික අයවැය චක්‍රලේඛ 03/2021 හි සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් නො වෙනස්ව එසේම බලපානු ඇත.

**එස්.ආර්.ආටිගල**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව